ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

# තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. නියමිත සුදුසුකම් සහිත අපේක්ෂකයන් විසින් සකස් කර ගන්නා ලද තම ජීවදත්ත සහිත අයදුම්පත් අධ්‍යාපන සහතික වල පිටපත් සමග **2024.01.29** දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, අංක. 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 8 යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (කරුණාකර ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළ අයදුම්කරන තනතුර සඳහන් කරන්න.)

## 01. රියදුරු (තනතුරු 01)

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම්**

අ) අ.පො.ස. (සා.පෙළ.) විභාගයේදී යටත් පිරිසෙන් එක් වරකදී විෂයන් දෙකක්වත් සමත් වී තිබීම.
ශිල්පීය නිපුණතා.
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කරන ලද මෝටර් රථ රියදුරු බලපත්‍රයක්/ බර වාහන රියදුරු බලපත්‍රයක් සමග අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද සහ ආයතනය විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් වීම අවශ්‍ය වේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ආ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන හා අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණියන්හි සේවයේ නියුතු අයට මේ සඳහා අයදුම් කළ හැකිය. මේ සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කරන ලද මෝටර් රථ රියදුරු බලපත්‍රයක්/ බර වාහන රියදුරු බලපත්‍රයක් සමග සහ ආයතනය විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් වීම අවශ්‍ය වේ.

**වයස :** අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුයි. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.)

**වැටුප හා වැටුප් පරිමාණය :**

PL-3-2016 රු. 26,290 - (10x270) (10x300) (10x330) (12x350) = රු. 39,490.00 මාසික

**සේවා හා කොන්දේසි**

1. තෝරා ගනු ලබන අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක දායකත්වයක් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සපයන අතර, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් ඒ සඳහා වැටුපෙන් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තයන්ගේ අරමුදලට (ETF) සඳහා 3% ක දායකත්වයක් ද කරනු ඇත.
2. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන්නේද යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.
3. රජයේ දෙපාර්තමේන්තුවක ස්ථිර තනතුරු දරන අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත්, ඔවුන්, ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් තමන් නිදහස් කර ගත යුතුය. අප ආයතනයේ සේවයේ නිරතව සිටින විට ඔවුනට විශ්‍රාම වැටුපට හිමිකමක් නොමැත.
4. ඉහත වැටුපට අමතරව රජය විසින් ලබාදෙන අනුමත සියලු දීමනා හිමිවේ.
5. අදාල තනතුර සඳහා පළපුරුද්ද ඇති අය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**අපැහැදිලි අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**පුවත්පත් කොමසාරිස්,**

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,**

**155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 8.**

SELACINE